NALANDA VIDYALAYA COLOMBO 10

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

NALANDA VIDYALAYA COLOMBO 10

| 10 ශ්‍රේණිය | ඉතිහාසය | 8 ඒකකය |
|---|---|---|

## මහනුවර රාජධානිය

❖ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- **වඩාත්ම නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01. සේනාසම්මත වික්‍රමබාහු රජතුමා සම්බන්ධයෙන් අදාළ වන නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1). ජයවීර බණ්ඩාරගෙන් පසු උඩරට පාලකයා බවට පත්වීම
(2). වීරසුන්දර බණ්ඩාර උපායශීලීව මරණයට පත්කිරීම
(3). ආරක්ෂාව පතා පෘතුගීසීන් වෙතට යෑම
(4). උඩරට රාජධානියේ ආරම්භක පාලකයා වීම

02. උඩරට පාලන සමයේ අදිකාරම්වරුන්ගේ ආඥා හෝ පණිවුඩ ප්‍රාදේශීය නිලධාරීන් කරා ගෙන ගිය පිරිස හැඳින්වූයේ කවර නමකින්ද?

(1). උණ්ඩිය රාල
(2). කටුපුල්ලේ පණිවිඩකරුවන්
(3). අශ්වාරෝහකයින්
(4). අඬබෙරකරුවන්

03. • දිසාවන් දොළහකින් සමන්විත වීම
• කෝරල පත්තු වශයෙන් බෙදා තිබීම
• ලියන රාල, උණ්ඩිය රාල වැනි නිලධාරීන් සිටීම

ඉහත තොරතුරු අදාළ වන්නේ මහනුවර රාජධානි සමයේ පැවති කුමන කාර්යාංශයටද?

(1). මහවාසල (2). රටවසම (3). විහාර දේපොල (4). බද්දෙ

04. කන්ද උඩරට බලයට පත් නායක්කර්වංශයේ ප්‍රථම පාලකයා වූයේ,

(1). කීර්ති ශ්‍රී රාජසිංහ
(2). රාජාධි රාජසිංහ
(3). ශ්‍රී විජය රාජසිංහ
(4). ශ්‍රී වික්‍රම රාජසිංහ

05. නායක්කර් වංශිකයකු වුවද බුද්ධාගමට අමිල සේවයක් කළ රජු නම්,

(1). කීර්ති ශ්‍රී රාජසිංහ
(2). ශ්‍රී විජය රාජසිංහ
(3). රාජාධි රාජසිංහ
(4). ශ්‍රී වික්‍රම රාජසිංහ

06. සියම් දේශයට දූතයන් යවා උපාලි හිමියන් ප්‍රමුඛ භික්ෂූන් මෙරටට වැඩමවා යලි උපසම්පදාව මෙරට පිහිටුවීමට කටයුතු කළ රජතුමා,

(1). පළමුවන විමලධර්මසූරිය රජතුමා
(2). දෙවන විමලධර්මසූරිය රජතුමා
(3). කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා
(4). රාජාධි රාජසිංහ

07. දෙවන විමලධර්මසූරිය රජු මෙරටට උපසම්පදාව ගෙන ඒමට පියවර ගත්තේ,

(1). සියමෙනි (2). මලයාසියාවෙනි (3). බුරුමයෙනි (4). ඉන්දියාවෙනි

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!


agaram.lk

08. මහනුවර යුගයේදී රටවසම ලෙසින් හැඳින්වුයේ,

(1). ප්‍රාදේශීය පාලනයයි
(3). මහවාසල කටයුතුයි
(2). බදු එකතු කරන සංවිධානයකි
(4). රටේ දණ්ඩනායකවරුන්ය

09. මහනුවර රාජධානිය පිළිබඳව පහත සඳහන් ප්‍රකාශ අතුරින් සාවද්‍ය ප්‍රකාශය,

(1). රටේ ඉහළම පාලන හා අධිකරණ බලතල රජතුමා සතුවිය
(2). පාලන කටයුතු සිදු වූයේ සම්ප්‍රදාය හා පෙර සිරිතට අනුවය
(3). සමාජ සම්බන්ධතා හා විවාහ කටයුතු කුල ක්‍රමය අනුව සිදුවීම
(4). රටේ සියලුම පුරවැසියන් නීතිය හමුවේ සමාන වීම

10. නව පෙලපතක් ආරම්භ කොට මහනුවර රාජධානියට ශක්තිමත් පදනමක් දමන ලද්දේ,

(1). සේනාසම්මත වික්‍රමබාහු රජුය
(3). පළමුවැනි විමලධර්මසූරිය රජුය
(2). දෙවැනි රාජසිංහ රජුය
(4). කීර්ති ශ්‍රී රාජසිංහ රජුය

11. උඩරට රාජධානි සමයේ පැවති ආර්ථිකයන් පිළිබඳව සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1). ස්වයංපෝෂිත ආර්ථික රටාවක් වීම
(2). කුල ක්‍රමය මත සමාජ සබඳතා පැවතීම
(3). වැඩි ඉඩම් ප්‍රමාණයක් හේන් වගාවට යෙදවීම
(4). අභ්‍යන්තර වෙළඳාමට කඩවීදි තිබීම

12. පළමුවන විමලධර්මසූරිය රජු උඩරට නීත්‍යානුකූල අයිතිය තහවුරු කර ගැනීමට අනුගමනය කළ පියවරක් නොවන්නේ,

(1). කුසුමාසන දේවිය විවාහ කර ගැනීමය
(2). දෙල්ගමු විහාරයේ සඟවා තිබූ දන්ත ධාතුව තමන් සතුකර ගැනීම
(3). ලන්දේසීන් සමඟ සාකච්ඡා කර ආධාර ගැනීම
(4). විමලධර්මසූරිය නමින් උඩරට රජවීම

13. කීර්ති ශ්‍රී රාජසිංහ රජු බෞද්ධ ප්‍රබෝධය ඇති කිරීමට අනුගමනය කළ ක්‍රියාමාර්ගයක් වන්නේ,

(1). ලංකාතිලක රිදී විහාරය වැනි විහාර අළුත්වැඩියාව
(2). ශ්‍රීපාද ස්ථානයේ නඩත්තුවට ගිලීමලේ පූජා කිරීම
(3). උපාලි හිමියන් සියම් දේශයෙන් වැඩමවා උපසම්පදාව පිහිටුවීම
(4). දළදා මාලිගයට පත්තිරිප්පුවක් එකතු කිරීම

14. පහත සඳහන් රජවරුන් අතුරෙන් නායක්කාර් රජවංශයේ රජවරුන් පිළිවෙලින් දක්වා ඇති පිළිතුර වන්නේ,

A. ශ්‍රී විජය රාජසිංහ
D. රාජාධිරාජසිංහ
B. ශ්‍රී වික්‍රම රාජසිංහ
E. ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ
C. කීර්ති ශ්‍රී රාජසිංහ

(1). ABED (2). ACDB (3). EBCD (4). CEAB

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

15. උඩරට මුල්වරට ස්වාධීන රාජධානියක් ලෙස ගොඩනැගුවේ කවුරුන්ද?
    (1). කරලියද්ද බණ්ඩාර
    (2). ජයවීර බණ්ඩාර
    (3). සේනාසම්මත වික්‍රමබාහු
    (4). I වන විමලධර්මසූරිය රජු

16. මහනුවර රාජධානියේ පරිපාලන ව්‍යුහයේ ඉහළින්ම සිටි මහාධිකාරම්වරු දෙදෙනෙකි. පළමු මහාධිකාරම්වරයා යටතේ පරිපාලනය නොවූ ප්‍රදේශය දැක්වෙන පිළිතුර කුමක්ද?
    (1). මාතලේ
    (2). සබරගමුව
    (3). වෙල්ලස්ස
    (4). නුවරකලාවිය

17. පහත දැක්වෙන පිළිතුරු අතරින් පළමු විමලධර්මසූරිය රජතුමා හා සම්බන්ධ සාවද්‍ය පිළිතුර කුමක්ද?
    (1). බුරුම දේශයෙන් උපසම්පදාව ගෙන ඒම
    (2). උඩරට රදළ ප්‍රධානීන්ගෙන් එල්ල වූ තර්ජන අවම කිරීම
    (3). කපු වගාවේ දියුණුවට අනුග්‍රහය ලබාදීම
    (4). ලංකාතිලකය, රිදී විහාරය හා ගඩලාදෙණිය වැනි පැරණි විහාර අළුත්වැඩියාව කිරීම

18. බ්‍රිතාන්‍යයන් ලංකාවට පැමිණෙන විට මහනුවර රාජධානියේ පාලකයා වූයේ,
    (1). ශ්‍රී වික්‍රම රාජසිංහ රජු
    (2). කීර්ති ශ්‍රී රාජසිංහ රජු
    (3). රාජාධි රාජසිංහ රජු
    (4). ශ්‍රී විජ රාජසිංහ රජු

19. උඩරට රාජධානිය පෘතුගීසීන්ට හෝ ලන්දේසීන්ට යටත් කර ගැනීමට නොහැකි වීමට බලපෑ හේතුවක් නොවන්නේ,
    (1). ස්වභාවික ආරක්ෂාව තිබීම
    (2). ජනතා පක්ෂපාතිත්වය රජුට හිමිවීම
    (3). ලස්කිරිඤ්ඤා හමුදාව උඩරට හමුදාවට එක්වීම
    (4). පෘතුගීසීන්ට හා ලන්දේසීන්ට ශක්තිමත් අවි බලයක් නොතිබීම

20. උඩරට රාජධානිය ඉංග්‍රීසින්ට යටත් වූයේ කුමන වර්ෂයේදීද?
    (1). 1816 දී
    (2). 1815 දී
    (3). 1829 දී
    (4). 1803 දී

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

## II කොටස

❖ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01. (අ). පහත දැක්වෙන ස්ථාන ලංකා සිතියමක ලකුණු කර දක්වන්න.

මහනුවර, මහවැලි ගඟ, බෝගම්බර වැව, බලන, හුන්නස්ගිරිය, කෝට්ටේ, ගම්පොළ, සීතාවක, දෙල්ගමුව, දන්තුරේ, ගඩලාදෙණිය, රන්දෙනිවල, මාතලේ

(ආ). පහත දැක්වෙන ස්ථාන ලෝක සිතියමක ලකුණු කර දක්වන්න.

බුරුමය, පෘතුගාලය, සියමය, බ්‍රිතාන්‍යය, ඕලන්දය

(ඇ). පහත දැක්වෙන පින්තූරය ආශ්‍රිතව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



(i). මෙහි දැක්වෙනුයේ කුමන රජකෙනෙකුගේ සිතුවමක්ද?

(ii). එම රජතුමා පාලනය කළ රාජධානිය කුමක්ද?

(iii). මෙම සිතුවම අඳින ලද්දේ කවුරුන් විසින්ද?

(iv). මෙම රජතුමා විසින් පෘතුගීසින්ව පරාජයට පත් කරන ලද සටන කුමක්ද?

02. (අ). පහත A, B සහ C වලින් දක්වා ඇති රජවරු රජවීමට පෙර භාවිත කළ නම් අනුපිළිවෙලින් ලියන්න.

A - පළමුවන රාජසිංහ රජු

B - දෙවන රාජසිංහ රජු

C - පළමුවන විමලධර්මසූරිය රජු (ල.03)

(ආ). මහනුවර රාජධානියේ පැවති පාලන කාර්යාංශ හතරක් නම් කරන්න. (ල.04)

(ඇ). පළමුවන විමලධර්මසූරිය රජතුමා මුහුණදුන් අභියෝග දෙකක් නම් කර ඒවා ජය ගැනීමට කටයුතු කළ අයුරු විස්තර කරන්න. (ල.05)

(ඈ). පළමුවන විමලධර්මසූරිය රජතුමා උඩරට රාජධානියේ බුදු දහම නගාසිටුවීමට හා ආර්ථික කටයුතු දියුණු කිරීමට අනුගමනය කළ ක්‍රියාමාර්ග දෙකක් විස්තර කරන්න. (ල.06)

03. (අ). මහනුවර රාජධානියට භාවිත කළ නම් දෙකක් හා ස්වභාවික ආරක්ෂාව සැපයූ දුර්ගයක් සඳහන් කරන්න. (ල.03)

(ආ). මහනුවර රාජධානියේ සිහසුනෙහි නීත්‍යානුකූල උරුමක්කාරත්වය ලබාගැනීමට I වන විමලධර්මසූරිය රජුට ඇතිවූ අභියෝග ජයගැනීමට ඔහු අනුගමනය කළ ක්‍රියාමාර්ග 4 ක් ලියන්න. (ල.04)

(ඇ). උඩරට ප්‍රධාන පාලකයා වශයෙන් රජුගේ බලය ක්‍රියාත්මක වූ ආකාරය පිළිබඳව කෙටි විස්තරයක් ලියන්න. (ල.05)

(ඈ). උඩරට සමාජ සංවිධානයේ පැවති සුවිශේෂී ලක්ෂණ කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල.06)



agaram.lk

04. (අ). උඩරට රාජධානි සමයේදී රජතුමා විසින් විසඳන ලද නඩු වර්ග 3 ක් ලියා දක්වන්න. (ල.03)

(ආ). පහත සඳහන් කාර්යයන් සඳහා ක්‍රියාත්මක වූ බද්දෙ සංවිධාන ලියා දක්වන්න.

A - අලිඇතුන් ඇල්ලීම සඳහා

B - ප්‍රවාහන කටයුතු සඳහා

C - වළං තැනීම සඳහා

D - රදාබද්ද (අලිඇතුන් ඇල්ලීම) (ල.04)

(ඇ). උඩරට රාජධානියේ ආර්ථිකය සකස් වී තිබූ ආකාරය කරුණු දෙකක් ඇසුරෙන් විස්තර කරන්න. (ල.05)

(ඈ). දෙවන රාජසිංහ රජතුමා සිය පාලන කාලයේදී මුහුණ දුන් අභියෝග තුනක් නම් කර ඉන් එකක් විස්තර කරන්න. (ල.06)

05. (අ). පහත A, B හා C වලින් අසා ඇති තොරතුරුවලට අදාළ පිළිතුරු අනුපිළිවෙලින් ලියන්න.

A - සෙනරත් රජු උඩරට රාජ්‍ය කොටස් තුනකට බෙදා මාතලේ ප්‍රදේශය පැවරුවේ කාටද?

B - උඩරට රාජධානියේ ''රට'' වශයෙන් හැඳින්වූ ප්‍රදේශයක් නම් කරන්න.

C - දිසාවන් භාරව සිටි නිලධාරින් හැඳින්වූ නම කුමක්ද? (ල.03)

(ආ). මහනුවර රාජධානි සමයේදී වැරදිකරුවන්ට ලබාදෙන ලද දඬුවම් වර්ග 4 ක් ලියන්න. (ල.04)

(ඇ). මහනුවර රාජධානි සමයේදී මෙරට පාලනය කළ පළමු රජවරුන් 5 දෙනා අනුපිළිවෙලින් ලියා දක්වන්න. (ල.05)

(ඈ). පහත සඳහන් රජවරුන් දෙදෙනා පිළිබඳව කෙටි විස්තරයක් ලියා දක්වන්න.


(i). ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා

(ii). කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා (ල.06)

*සැකසුම: එම්.ජී.එස්. දිල්රුක්ෂි කුමාරි මිය*

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

Agaram.LK - Keep your dreams alive!




Agaram.LK - Keep your dreams alive!



agaram.lk

Agaram.LK - Keep your dreams alive!



Agaram.LK - Keep your dreams alive!